# අධ්‍යාපන අමාත්‍යාංශය

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය

# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

# පුරප්පාඩු

**අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සහ ලං.ජ.කා.අ.ආයතනීය ආණමඩුව කලාපීය මධ්‍යස්ථානයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. නියෝජ්‍ය අධ්‍යක්ෂ - නියෝජ්‍ය විදුහල්පති - (HM 1-3)

**සුදුසුකම්**

**බාහිර**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක මෝටර් කාර්මික/ යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව උපාධියක් ලබා තිබීම.

**සහ**

ඉංජිනේරු ක්ෂේත්‍රයේ හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් සමඟ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමෙහි අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් සහ ඉන් වසර 02 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සංවිධානයක පිළිගත හැකි යහපත් සේවා වාර්තාවක් තිබීම.

**හෝ**

ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

කළමනාකරණ මට්ටමෙහි අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් සහ ඉන් වසර 02 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සංවිධානයක පිළිගත හැකි යහපත් සේවා වාර්තාවක් තිබීම.

**අභ්‍යන්තර -**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (HM1-1) මට්ටමෙහි තනතුරු වන ප්‍රධාන ඉංජිනේරු - (පුහුණු), ප්‍රධාන ඉංජිනේරු (නිෂ්පාදන, සේවා හා නඩත්තු) තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | - | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව,<br>HM 1-3 - රු. 86,865 - 2270X15 - 120,195/-<br>(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.) |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | - | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **වයස් සීමාව** | - | අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

## 02. ප්‍රධාන ඉංජිනේරු - පුහුණු - (HM 1-1)

**සුදුසුකම් .**

**බාහිර**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක මෝටර් කාර්මික/ යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (විද්‍යාපති) ලබාතිබීම හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක සාමාජිකත්වය ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමෙහි අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ආ) පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ සාමාජිකත්වය (Fellow Membership) ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමෙහි අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමනාකරණ (MM) සේවා ගණයෙහි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | - | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව,<br>HM 1-1 - රු. 80,295 - 2270X15 -114345/-<br>(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.) |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | - | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **වයස් සීමාව** | - | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

## 03. ලේඛකාධිකාරී - (HM 1-1)

**සුදුසුකම් බාහිර**

(අ) මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, වාණිජ, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධියක් සමග පශ්චාත් උපාධි සුදුසුකම් (ශාස්ත්‍රපති) ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක " කළමනාකරණ මට්ටමෙහි" අවම වශයෙන් වසර දහතුනක (13) සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

(අ) තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Corporate Membership) ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමෙහි" අවම වශයෙන් වසර දහතුනක (13) සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර -**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම (ශාස්ත්‍රපති) ලබා තිබීම සමග තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමනාකරණ සේවා ගණයෙහි (MM) ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප් ප්‍රමාණය** | - | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව,<br>HM 1-1 - රු. 80,295 - 2270X15 -114345/=<br>(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.) |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | - | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **වයස් සීමාව** | - | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

## 04. සැලසුම් නිලධාරී - (JM 1-1)

**සුදුසුකම්**

**බාහිර**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක රාජ්‍ය පරිපාලන, ව්‍යාපාර පරිපාලන හෝ ආර්ථික විද්‍යා උපාධියක් සමග රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ ධාරිතාවයෙහි සැලසුම්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන (MA 1-2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග සැලසුම්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රයේ වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | - | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව,<br>JM 1-1 - රු. 42,600 - 755X10-1135X18-70,580/-<br>(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.) |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | - | තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **වයස් සීමාව** | - | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

## 05. උපදේශක - (MA 2–2)

**ලං.ජ.කා.අ.ආයතනය**

(මෝටර් කාර්මික, වායු සමීකරණ හා ශීතකරණ, බල විදුලි සහ වාහන අලුත් වැඩියා හා පින්තාරු ක්ෂේත්‍රයන්හි පමණක් පුරප්පාඩු පවතී) ලං.ජ.කා.අ.ආයතනීය ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය

(මෝටර් කාර්මික, මිල්රයිට්, වාහන විදුලි, ඩීසල් පොම්ප සහ පැස්සුම් යන ක්ෂේත්‍රයන්හි පමණක් පුරප්පාඩු පවතී)

**වෘත්තීය**

පිළිගත් ආයතනයකින් මෝටර් කාර්මික / මෙකාට්‍රොනික්/ මිල්රයිට්/ බල විදුලි/ ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍රණ/වාහන විදුලි ඩීසල් පොම්ප/පැස්සුම්/මෝටර් රථ බොඩි අළුත්වැඩියා හා පින්තාරු ශිල්පය යන ක්ෂේත්‍ර හෝ ලං.ජ.කා.අ.ආයතනයට අදාළ අනෙකුත් ක්ෂේත්‍රයන්හි NVQ 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම සමඟ ලං.ජ.කා.අ.ආයතනයේ පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා පංති සාමාර්ථයක් ලබා තිබීම (I හෝ II පංති)

**හෝ**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෝටර් කාර්මික/මෙකාට්‍රොනික්/මිල්රයිට්/බල විදුලි/ශීතකරණ හා වායුසමීකරණ, යන්ත්‍රණ/වාහන විදුලි/ඩීසල් පොම්ප/පැස්සුම්/මෝටර් රථ බොඩි අළුත්වැඩියා හා පින්තාරු ශිල්පය යන ක්ෂේත්‍රවලට අදාළව වසර 04, 03 1/2 හෝ 03 ක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා (I හෝ II පංති) පංති සාමාර්ථයක් ලබා තිබීම හා කර්මාන්තයේ වසර 03 ක පළපුරුද්ද හෝ පිළිගත් පුහුණු ආයතනයක අදාළ විෂයයන් ඉගැන්වීම පිළිබඳව අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | - | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව,<br>MA 2-2 - රු. 30,310 - 300X10-350X07-600X04-710X20-52,360/-<br>(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.) |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | - | තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **වයස් සීමාව** | - | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

## 06. උපදේශක - දෙමළ මාධ්‍ය - (MA 2 – 2)

**වෘත්තීය -**

පිළිගත් ආයතනයකින් මෝටර් කාර්මික/මෙකාට්‍රොනික්/මිල්රයිට්/බල විදුලි/ශීතකරණ හා වායු සමීකරණ/යන්ත්‍රණ/ වාහන විදුලි/ ඩීසල් පොම්ප/පැස්සුම්/මෝටර් රථ බොඩි අළුත්වැඩියා හා පින්තාරු ශිල්පය යන ක්ෂේත්‍ර හෝ ලං.ජ.කා.අ.ආයතනයට අදාළ අනෙකුත් ක්ෂේත්‍රයන්හි NVQ 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම සමඟ ලං.ජ.කා.අ.ආයතනයේ පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා පංති සාමාර්ථයක් ලබා තිබීම (I හෝ II පංති)

**හෝ**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෝටර් කාර්මික/ මෙකාට්‍රොනික්/මිල්රයිට්/බල විදුලි/ ශීතකරණ හා වායු සමීකරණ/යන්ත්‍රණ/වාහන විදුලි/ඩීසල් පොම්ප/පැස්සුම්/මෝටර් රථ බොඩි අළුත්වැඩියා හා පින්තාරු ශිල්පය යන ක්ෂේත්‍රවලට අදාළව වසර 04. 03 1/2 හෝ 03 ක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා (I හෝ II පංති) පංති සාමාර්ථයක් ලබා තිබීම හා කර්මාන්තයේ වසර 03 ක පළපුරුද්ද හෝ පිළිගත් පුහුණු ආයතනයක අදාළ විෂයයන් ඉගැන්වීම පිළිබඳව අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | - | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව,<br>MA 2-2 - රු. 30,310 - 300X10-350X07-600X04-710X20-52,360/-<br>(මීට අමතරව රජය මගින් අනුමත ජීවන වියදම් දීමනාව සඳහා හිමිකම් ලබයි.) |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | - | තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **වයස් සීමාව** | - | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

**සියලුම තනතුරු සඳහා අදාල පොදු කොන්දේසි -**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරුවලට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු/ ඇය එම කාලසීමාව අවසානයේ දී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් වසර 01 ක වැඩ බලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරුවලට බඳවා ගැනීම් අදාළ තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 08% ක් අයකර ගනු ලබන අතර ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් වේ.

**අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.**

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික

(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

(ඈ) ජාතික හැඳුනුම්පත

දැනට රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතු අතර අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා සහතික කළ යුතුය. ඥාතීන් නොවන ඔබ පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුලත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමඟ 2024.06.17 දිනට ප්‍රථම **කළමනාකාර පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර නිවැරදිව සඳහන් කළයුතු අතර කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ - විදුහල්පති**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,**
**අංක 582, ගාලු පාර, ගල්කිස්ස.**